සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

56581

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2012 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2012 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2012

නව නිර්දේශය
புதிய பாடத்திட்டம்
New Syllabus

ව්‍යාපාර අධ්‍යයනය I
வணிகக் கல்வி I
Business Studies I

32 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

විභාග අංකය : ....

උපදෙස්:

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* විභාග අංකය, ඉහළින් ඇති කොටුවේ පැහැදිලිව සටහන් කරන්න.
* අංක **1** සිට **30** තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා එහි අංකය ප්‍රශ්නය ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.
* අංක **31** සිට **50** තෙක් වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු අදාළ තිත් ඉරි මත ලියන්න.
* සෑම ප්‍රශ්නයකට ම ලකුණු **දෙක** බැගින් හිමි වේ.

පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි.

I පත්‍රය සඳහා	
ප්‍රශ්න අංකය	**ලකුණු**
01 - 30	
31 - 50	
එකතුව	

	අත්සන	**සංකේත අංක**
1 වන පරීක්ෂක		
2 වන පරීක්ෂක		
අති. ප්‍රධාන පරීක්ෂක		
ප්‍රධාන පරීක්ෂක		
ගණිත පරීක්ෂක		

1. පහත සඳහන් ද අතුරෙන් **චුවමනා** ලෙස සලකනු ලබන්නේ,
(1) සන්නිවේදනයයි. (2) ප්‍රවාහනයයි. (3) අධ්‍යාපනයයි. (4) රක්ෂණයයි. (5) සෞඛ්‍යයයි. (.........)

2. පහත දක්වෙන්නේ කිසියම් භාණ්ඩ වර්ගීකරණයකට අයත් අයිතමයන් ය.
පහසු භාණ්ඩ, සාප්පු භාණ්ඩ, විශේෂිත භාණ්ඩ, නොසෙවූ භාණ්ඩ
එම භාණ්ඩ වර්ගීකරණය කුමක් ද?
(1) කල්පවතින භාණ්ඩ (2) කල් නොපවතින භාණ්ඩ
(3) පාරිභෝගික භාණ්ඩ (4) කාර්මික භාණ්ඩ
(5) අන්තර් භාණ්ඩ (.........)

3. පහත දක්වෙන්නේ ව්‍යාපාර පරිසරයට අයත් බලවේග කිහිපයකි.
A - කළමනාකරුවෝ B - තරගකරුවෝ C - සේවකයෝ
D - ගනුදෙනුකරුවෝ E - අයිතිකරුවෝ F - විභව ව්‍යාපාරිකයෝ
G - සැපයුම්කරුවෝ
මේ අතුරෙන් ආසන්න පරිසරයට අදාළ බලවේග පමණක් ඇතුළත් කාණ්ඩය තෝරන්න.
(1) A, C, E, G (2) B, D, F, G (3) A, B, D, F (4) B, D, E, G (5) B, C, F, G (.........)

4. ව්‍යාපාරයකින් ඉටු විය යුතු සමාජ වගකීම් කිහිපයක් පහත දක්වේ.
A - කාර්යක්ෂම කළමනාකරණය B - වෘත්තීමය ආරක්ෂාව C - ප්‍රජා සත්කාරය
D - විනිවිදභාවය E - ආරක්ෂිත නිෂ්පාදිත F - සෞඛ්‍ය පහසුකම්
G - අපද්‍රව්‍ය කළමනාකරණය H - රැකියා නියුක්තියට දයක වීම I - සමානාත්මතාව
මේවා අතුරෙන් සේවක පාර්ශ්වයට පමණක් ඉටු විය යුතු සමාජ වගකීම් ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) A, D, F (2) B, E, H (3) C, F, G (4) A, D, I (5) B, F, I (.........)

5. පහත දක්වෙන්නේ පාරිභෝගික අයිතිවාසිකම් සහ පාරිභෝගික වගකීම් කිහිපයකි.
A - තොරතුරු දැනගැනීම B - විචාරාත්මක දැනුවත්භාවය
C - සමාජය ගැන සැලකිලිමත් වීම D - තෝරා ගැනීම
E - සෞඛ්‍ය සම්පන්න පරිසරයක ජීවත් වීම F - පරිසරය ගැන දැනුවත් වීම
G - සවන් යොමු කරවා ගැනීම H - සහයෝගීතාව
ඉහත සඳහන් ද අතුරෙන් පාරිභෝගික වගකීම් පමණක් ඇතුළත් කාණ්ඩය තෝරන්න.
(1) A, B, D, F (2) B, C, F, H (3) B, E, G, H (4) B, C, E, F (5) C, F, G, H (.........)

6. ISO 9001 : 2008 ප්‍රමිතිය යනු,
(1) පාරිසරික කළමනාකරණ පද්ධති සහතිකකරණයයි.
(2) ආහාර ආරක්ෂණ කළමනාකරණ පද්ධති සහතිකකරණයයි.
(3) තත්ත්ව කළමනාකරණ පද්ධති සහතිකකරණයයි.
(4) සමාජ වගකීම් සහතිකකරණයයි.
(5) වෘත්තීය සෞඛ්‍ය හා සුරක්ෂිතතා කළමනාකරණ පද්ධති සහතිකකරණයයි. (.........)

[දෙවෙනි පිටුව බලන්න.

7. හවුල් ව්‍යාපාර සම්බන්ධයෙන් **සාවද්‍ය** ප්‍රකාශය තෝරන්න.
(1) අවම හවුල්කරුවන් සංඛ්‍යාව දෙකක් වන අතර උපරිම සංඛ්‍යාව විස්සකට සීමා වීම
(2) යම් ව්‍යාපාරයක් පවත්වාගෙන යාමට හවුල්කරුවන් එකඟ වීම
(3) සෑම හවුල්කරුවකු ම තමාගේ හා සෙසු හවුල්කරුවන්ගේ නියෝජිතයකු හා ප්‍රධානියකු වශයෙන් සැලකීම
(4) ලිඛිත ගිවිසුමක් නොමැතිව හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යා නොහැකි වීම
(5) හවුල් ව්‍යාපාරයකට නෛතික පුද්ගලභාවයක් නොමැති වීම (.........)

8. සීමාසහිත පොදු සමාගමක කොටස් හෝ ණයකර සඳහා සහභාගී වන ලෙස මහජනතාවට ආරාධනා කරමින් සමාගම විසින් ප්‍රසිද්ධ කරනුයේ,
(1) සාංගමික ව්‍යවස්ථාවලියයි. (2) සාංගමික සංස්ථා පත්‍රයයි.
(3) ව්‍යවස්ථානුකූල ප්‍රකාශයයි. (4) ප්‍රතිෂ්ඨාවයි.
(5) සංස්ථා ප්‍රකාශයයි. (.........)

9. ව්‍යවසායකත්ව සංවර්ධනයට බලපාන සාධක සහ ඊට එරෙහිවන සාධක කිහිපයක් පහත දැක්වේ.
A - මනෝ විහිතිය (Mindset)
B - පරිකල්පනික චින්තනය (Imaginary thinking)
C - ආදර්ශ චරිත (Role models)
D - අනුකරණය (Replication)
E - අත්දැකීම් (Experiences)
F - ගතානුගතික බව (Being Traditional)
ඉහත ද අතුරෙන් ව්‍යවසායකත්ව සංවර්ධනයට එරෙහිවන සාධක පමණක් ඇතුළත් කාණ්ඩය තෝරන්න.
(1) A, D, F (2) B, C, E (3) B, C, D (4) C, D, E (5) D, E, F (.........)

10. චෙක්පත් රේඛනය කෙරෙන ආකාර කිහිපයක් පහත දක්වේ.



ඉහත රේඛන අතුරෙන් සාමාන්‍ය රේඛන පමණක් ඇතුළත් කාණ්ඩය තෝරන්න.
(1) A, B, C (2) A, D, E (3) B, D, E (4) B, E, F (5) C, D, E (.........)

11. ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුණු සහ කාර්යයන් කිහිපයක් පහත දක්වේ.
A - මූල්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවීම
B - විනිමය අනුපාතික ප්‍රතිපත්තිය මෙහෙයවීම
C - මිල ස්ථායිතාව පවත්වාගෙන යාම
D - ව්‍යවහාර මුදල් නිකුත් කිරීම හා බෙද හැරීම
E - මූල්‍ය ක්‍රමයේ ස්ථායිතාව පවත්වාගෙන යාම
මේවා අතුරෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යයන් වනුයේ,
(1) A, B, C (2) A, C, E (3) B, D, E (4) C, D, E (5) A, B, D (.........)

12. රක්ෂණය සම්බන්ධ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් එකක් සාවද්‍ය ය. එම **සාවද්‍ය** ප්‍රකාශය තෝරන්න.
(1) පුද්ගලයකුගේ ජීවිතය පිළිබඳ ඔහුට/ඇයට ඇති රක්ෂණීය අයිතිය අසීමිත ය.
(2) පුද්ගලයකුට සිය භාර්යාව හෝ ස්වාමිපුරුෂයා පිළිබඳ රක්ෂ්‍ය හිමිකමක් නැත.
(3) තමන් උකසට ගත් භාණ්ඩ පිළිබඳ ව රක්ෂ්‍ය හිමිකමක් උකස්කරුට ඇත.
(4) පුද්ගලයකුට සිය දරුවන්ගේ හෝ නෑදෑයින්ගේ ජීවිත පිළිබඳ රක්ෂ්‍ය හිමිකමක් නැත.
(5) ජීවිත හා පුද්ගල අහඹු රක්ෂණය සම්බන්ධයෙන් හානිපූරණ මූලධර්මය අදාළ නො වේ. (.........)

13. ප්‍රවාහනයේ සමතුලිත සංවර්ධනයක් සඳහා අවශ්‍ය වන්නේ,
(1) වේගවත් හා සුරක්ෂිත ප්‍රවාහන ක්‍රම හඳුන්වා දීමයි.
(2) මහා මාර්ග, දුම්රිය මාර්ග හා ජල ප්‍රවාහන මාර්ග සංවර්ධනය කිරීමයි.
(3) වරාය, ගුවන්තොටුපළවල්, බස් හා දුම්රිය නැවතුම්පළවල් සංවර්ධනය කිරීමයි.
(4) ප්‍රවාහනය සඳහා බස්, ලොරි, දුම්රිය, ගුවන්යානා සහ නැව් යනාදිය වැඩියෙන් යෙදවීම යි.
(5) මාර්ග, නැවතුම්පළවල්, රථවාහන සහ බලය සංවර්ධනය කිරීමයි. (.........)

[තුන්වෙනි පිටුව බලන්න.

14. පහත වගුවේ X තීරුවේ සන්නිවේදන මාධ්‍ය සහ Y තීරුවේ සන්නිවේදන ක්‍රම සඳහන් වේ.

X	Y
A. වාචික B. ලිඛිත C. විද්‍යුත් D. සංඥා හා සංකේත	1. ලිපිය 2. රැස්වීම් 3. හඬ තැපැල 4. සීනුව 5. මෙමෝ පත්‍ර 6. රථවාහන හැසිරවීමේ විදුලි පහන් 7. සාකච්ඡා 8. පේජර් (Pagers)

X හා Y තීරු නිවැරදි ව ගළපා ඇති කාණ්ඩය තෝරන්න.

(1) A - 2 සහ 7, B - 1 සහ 5, C - 3 සහ 8, D - 4 සහ 6
(2) A - 2 සහ 3, B - 1 සහ 8, C - 4 සහ 7, D - 5 සහ 6
(3) A - 2 සහ 7, B - 1 සහ 5, C - 6 සහ 8, D - 3 සහ 4
(4) A - 2 සහ 8, B - 1 සහ 5, C - 3 සහ 7, D - 4 සහ 6
(5) A - 1 සහ 7, B - 2 සහ 5, C - 3 සහ 8, D - 4 සහ 6 (.........)

15. සංවිධානයක අරමුණු අපේක්ෂිත ආකාරයෙන් ඉටු කරගැනීමට මග පෙන්වනුයේ,

(1) කළමනාකරණ ක්‍රියාවලියයි. (2) සැලසුම්කරණයයි.
(3) සංවිධානකරණයයි. (4) මෙහෙයවීමයි.
(5) පාලනයයි. (.........)

16. පහත වගුවේ X තීරුවේ කළමනාකරණ කාර්යයන් දැක්වෙන අතර ඒවාට අදාළ ක්‍රියාකාරකම් Y තීරුවේ දැක්වේ.

X	Y
A. සැලසුම්කරණය B. සංවිධානකරණය C. මෙහෙයවීම D. පාලනය	1. කාර්යඵල මැනීම හා විචලතා හඳුනාගැනීම 2. අභිප්‍රේරණය හා සන්නිවේදනය 3. අධිකාරිය හා වගකීම් පැවරීම 4. අරමුණු හා පරමාර්ථ ස්ථාපිත කිරීම

X හා Y තීරු නිවැරදිව ගළපා ඇති පිළිතුර තෝරන්න.

(1) A - 1, B - 2, C - 3, D - 4 (2) A - 3, B - 4, C - 2, D - 1
(3) A - 2, B - 3, C - 4, D - 1 (4) A - 4, B - 3, C - 2, D - 1
(5) A - 4, B - 3, C - 1, D - 2 (.........)

17. සංවිධානකරණ මූලධර්ම කිහිපයක් පහත වගුවේ X තීරුවේ දැක්වෙන අතර අදාළ අර්ථ දැක්වීම් Y තීරුවේ දැක්වේ.

X	Y
A. අණකිරීමේ දාමය	1. සංවිධානයක කළමනාකරුවකුට ලැබෙන නීත්‍යානුකූල බලය
B. පාලන අවකාශය	2. තම කටයුතුවල ප්‍රතිඵල පිළිබඳ ව සුපරීක්ෂකට වාර්තා කිරීමට හා සාධාරණීකරණය කිරීමට ඇති බැඳීම
C. අධිකාරිය	3. එක් කළමනාකරුවකුට සෘජුව වාර්තා කරන සහකරුවන් සංඛ්‍යාව
D. වගවීම	4. ඉහළ කළමනාකරණයේ සිට පහළ කළමනාකරණය තෙක් නොකැඩුණු අධිකාරී මාර්ගය

X තීරුව හා Y තීරුව නිවැරදි ව ගැළපූ විට ලැබෙන පිළිතුර වන්නේ,

(1) A - 1, B - 3, C - 4, D - 2 (2) A - 2, B - 3, C - 1, D - 4
(3) A - 4, B - 3, C - 1, D - 2 (4) A - 3, B - 4, C - 1, D - 2
(5) A - 4, B - 1, C - 3, D - 2 (.........)

18. නිෂ්පාදිතයක් නිර්මාණය කිරීමටත්, නිෂ්පාදනය කිරීමටත් අදාළ සියලු අංග සමායෝජනය කිරීම හා පාලනය කිරීම සඳහා යොදා ගැනෙන පරිගණක තාක්ෂණය හඳුන්වනු ලබන්නේ,

(1) CAD ලෙස ය. (2) CAM ලෙස ය. (3) CIM ලෙස ය.
(4) CNC ලෙස ය. (5) Robotics ලෙස ය. (.........)

19. මෙහෙයුම් ක්‍රියාවලියට අදාළ කම්හල් පිරියත ක්‍රම X තීරුවේ ද, ඒවාට අදාළ හැඳින්වීම් Y තීරුවේ ද දක්වේ.

X	Y
A. ක්‍රියාවලි පිරියත B. නිෂ්පාදිත පිරියත C. කුටි පිරියත D. ස්ථාවර ස්ථානීය පිරියත	1. එක සමාන යන්ත්‍ර එක් මධ්‍යස්ථානයකට ඒකරාශී කර නිෂ්පාදන කටයුතු ගලා යන ආකාරයට සිදු කිරීම 2. නිෂ්පාදනයේ එක් එක් කාර්යය සම්පූර්ණ කිරීමට අවශ්‍ය සියලු පහසුකම් එක ම ස්ථානයක සිදුවන ආකාරයට පිළියෙල කිරීම 3. අවශ්‍ය ද්‍රව්‍ය, උපකරණ හා ශ්‍රමය යනාදී යෙදවුම් නිෂ්පාදිතය නිපදවන ස්ථානයට ඒකරාශී කිරීම 4. සමස්ත නිෂ්පාදන ක්‍රියාවලිය, එක් කාර්ය ස්ථානයකින් ඊළඟ කාර්ය ස්ථානයට රේඛීයව ගලා යන ආකාරයට පිළියෙල කිරීම

X තීරුව හා Y තීරුව නිවැරදි ව ගැළපූ විට ලැබෙන පිළිතුර කුමක් ද?

(1) A - 1, B - 4, C - 2, D - 3
(2) A - 2, B - 1, C - 4, D - 3
(3) A - 4, B - 2, C - 1, D - 3
(4) A - 2, B - 4, C - 3, D - 1
(5) A - 4, B - 1, C - 2, D - 3 (………)

20. අලෙවිකරණ සංකල්ප X තීරුවේ ද, එම සංකල්පවලට අදාළ පැහැදිලි කිරීම Y තීරුවේ ද දක්වේ.

X	Y
A. නිෂ්පාදන සංකල්පය B. නිෂ්පාදිත සංකල්පය C. විකුණුම් සංකල්පය D. අලෙවිකරණ සංකල්පය E. සාකල්‍යවාදී අලෙවිකරණ සංකල්පය	1. ඉලක්ක වෙළඳපොළේ අවශ්‍යතා සහ වුවමනා හඳුනාගෙන ඊට අනුකූල ව භාණ්ඩ හා සේවා නිපදවා ඉදිරිපත් කිරීම 2. දැඩි ප්‍රවර්ධනයක් කළහොත් පාරිභෝගිකයින්, නිෂ්පාදිත මිලට ගනු ඇතැයි විශ්වාස කිරීම 3. ව්‍යාපාරයේ සියලු ම පාර්ශ්වයන් එක ම අරමුණකින් යුතුව කටයුතු කිරීම වැදගත් යැයි අවධාරණය කිරීම 4. උසස් ගුණාත්මක භාණ්ඩ නිපදවා සාධාරණ මිලකට වෙළඳපොළට සැපයීම මගින් ඒවාට ඉල්ලුමක් ඇති වේය යන විශ්වාසය 5. භාණ්ඩ නිපදවා සාධාරණ මිලකට වෙළෙඳපොළ තුළ සුලභ කළහොත් පාරිභෝගිකයා ඒවා මිලට ගන්නේ ය යන විශ්වාසය

X තීරුව හා Y තීරුව නිවැරදි ව ගැළපූ විට ලැබෙන පිළිතුර කුමක් ද?

(1) A - 5, B - 1, C - 2, D - 4, E - 3
(2) A - 5, B - 4, C - 2, D - 1, E - 3
(3) A - 4, B - 5, C - 2, D - 1, E - 3
(4) A - 5, B - 4, C - 3, D - 1, E - 2
(5) A - 1, B - 3, C - 5, D - 2, E - 4 (………)

21. පහත දක්වෙන්නේ අලෙවිකරණ මිශ්‍රයේ විචල්‍යවලට අදාළ උපකරණ (tools) කිහිපයකි.

A - සන්නම		B - වට්ටම්
C - ප්‍රචාරණය		D - බෙදහැරීමේ මාර්ග
E - ප්‍රවාහනය		F - ඇසුරුම
G - ගෙවීම් කොන්දේසි		H - ගුණත්වය
I - සෘජු අලෙවිකරණය		J - වගකීම (warranty)
K - මහජන සම්බන්ධතා		L - ඉසව් හා අත්දැකීම්

ඉහත සඳහන් ද අතුරෙන් නිෂ්පාදිතයට පමණක් අදාළ උපකරණ ඇතුළත් පිළිතුර වනුයේ,

(1) A, C, F හා I ය.
(2) B, C, E හා L ය.
(3) C, I, K හා L ය.
(4) D, H, I හා J ය.
(5) A, F, H හා J ය. (………)

22. උසස් ගුණත්වයෙන් යුක්ත භාණ්ඩ සඳහා සාධාරණ අඩුමිලක් නියම කිරීම,

(1) පිරිවැයට ලාභාන්තිකයක් එකතුකළ මිල කිරීමයි. (Mark-up pricing)
(2) ඉලක්ක ඉපයුම් මිල කිරීමයි. (Target return pricing)
(3) සංජානනීය වටිනාකම් මිල කිරීමයි. (Perceived value pricing)
(4) වටිනාකම් මිල කිරීමයි. (Value pricing)
(5) පවත්නා මිල මත මිල කිරීමයි. (Going rate pricing) (………)

23. පහත වගුවේ X තීරුවේ මූල්‍ය කළමනාකරුවකුගේ ප්‍රධාන තීරණ දක්වෙන අතර Y තීරුවේ ඒ ඒ ප්‍රධාන තීරණ යටතේ ලා සැලකෙන උපතීරණ දක්වේ.

X	Y
A. දිගුකාලීන ආයෝජන තීරණ	1. වෙළඳ ණය හිමියන් පිළිබඳ තීරණ
B. කෙටිකාලීන ආයෝජන තීරණ	2. වෙළඳ ණය ගැතියන් පිළිබඳ තීරණ
C. දිගුකාලීන මූල්‍යන තීරණ	3. ලාභ රඳවාගැනීම පිළිබඳ තීරණ
D. කෙටිකාලීන මූල්‍යන තීරණ	4. ව්‍යාපාර නවීකරණ පිළිබඳ තීරණ

X හා Y තීරුව නිවැරදි ව ගැළපූ විට ලැබෙන පිළිතුර කුමක් ද?

(1) A - 3, B - 1, C - 4, D - 2
(2) A - 2, B - 3, C - 4, D - 1
(3) A - 4, B - 1, C - 3, D - 2
(4) A - 3, B - 4, C - 2, D - 1
(5) A - 4, B - 2, C - 3, D - 1 (.........)

24. පහත දක්වෙන කාණ්ඩ අතුරෙන් ප්‍රාග්ධන වෙළඳපොළට අදාළ උප වෙළඳපොළවල් පමණක් දක්වෙන කාණ්ඩය තෝරන්න.
(1) කොටස් වෙළඳපොළ, භාණ්ඩාගාර බිල්පත් වෙළඳපොළ, දේශීය විදේශ විනිමය වෙළඳපොළ
(2) භාණ්ඩාගාර බැඳුම්කර වෙළඳපොළ, සාංගමික බැඳුම්කර වෙළඳපොළ, කොටස් වෙළඳපොළ
(3) භාණ්ඩාගාර බැඳුම්කර වෙළඳපොළ, සාංගමික බැඳුම්කර වෙළඳපොළ, වාණිජ පත්‍රිකා වෙළඳපොළ
(4) භාණ්ඩාගාර බිල්පත් වෙළඳපොළ, භාණ්ඩාගාර බැඳුම්කර වෙළඳපොළ, වාණිජ පත්‍රිකා වෙළඳපොළ
(5) භාණ්ඩාගාර බිල්පත් වෙළඳපොළ, භාණ්ඩාගාර බැඳුම්කර වෙළඳපොළ, සාංගමික බැඳුම්කර වෙළඳපොළ (.........)

25. විශාල ප්‍රකාශිත ප්‍රාග්ධනයක් සහිත හොඳින් ස්ථාපිත සමාගම් ලැයිස්තුගත කිරීම සඳහා වෙන් වූ පුවරුව,
(1) දිරිසවි පුවරුවයි. (2) දෙවන පුවරුවයි. (3) ප්‍රධාන පුවරුවයි.
(4) කඩකල පුවරුවයි. (5) මුදල් පුවරුවයි. (.........)

26. පහත සඳහන් වන්නේ සේවකයින් ආකර්ෂණය කර ගැනීමේ මාර්ග කිහිපයකි.
A - රැකියාපොළ
B - කුසලතා ලේඛන
C - අන්තර්ජාල වෙබ් අඩවි
D - අභ්‍යන්තර ජාලය
E - අනුප්‍රාප්තික සැලසුම්
F - වෘත්තීය ආයතන
G - අධ්‍යාපන ආයතන
H - සේවකයින්ගේ හඳුන්වාදීම්
මේවා අතුරින් අභ්‍යන්තර ආකර්ෂණ මාර්ග පමණක් ඇතුළත් කාණ්ඩය වන්නේ,
(1) A, B, D, E ය. (2) B, C, F, H ය. (3) C, D, E, F ය.
(4) B, D, E, H ය. (5) D, E, F, G ය. (.........)

27. පහත X හා Y වගුවල දක්වෙන්නේ මානව සම්පත් කළමනාකරණයට සම්බන්ධ තොරතුරු කිහිපයකි.

X	Y
A. සේවක අයිතිවාසිකම්	1. රැකියා ගිවිසුමට අනුව කාර්යයන් ඉටු කරවා ගැනීම
B. සේවක වගකීම්	2. යහපත් වැඩ පරිසරයක් පවත්වා ගැනීම
C. සේව්‍ය අයිතිවාසිකම්	3. වෘත්තීය අනතුරුවලින් ආරක්ෂාව තහවුරු කර ගැනීම
D. සේව්‍ය වගකීම්	4. සංවිධානයේ අරමුණු ඉටුවන පරිදි වැඩ කිරීම

X හා Y තීරු නිවැරදි ව ගැළපා ඇති කාණ්ඩය තෝරන්න.

(1) A - 2, B - 1, C - 3, D - 4
(2) A - 1, B - 2, C - 3, D - 4
(3) A - 3, B - 2, C - 1, D - 4
(4) A - 4, B - 3, C - 1, D - 2
(5) A - 3, B - 4, C - 1, D - 2 (.........)

28. පහත වගුවේ X තීරුවේ දක්වෙන්නේ තොරතුරු වර්ගීකරණය සඳහා යොදගැනෙන පදනම් ය. Y තීරුවේ දක්වෙන්නේ ඒ පදනම් යටතට ගැනෙන වර්ගීකරණයන් ය.

X	Y
A. මූලාශ්‍රය	1. අතීත, වර්තමාන
B. ස්වභාවය	2. ප්‍රමාණාත්මක, ගුණාත්මක
C. කළමනාකරණ මට්ටම්	3. බාහිර, අභ්‍යන්තර
D. කාලය	4. මෙහෙයුම්, උපක්‍රමික

X හා Y නිවැරදි ව ගැළපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

(1) A - 2, B - 3, C - 4, D - 1
(2) A - 3, B - 2, C - 4, D - 1
(3) A - 3, B - 4, C - 2, D - 1
(4) A - 1, B - 2, C - 4, D - 3
(5) A - 4, B - 2, C - 3, D - 1 (.........)

29. සංවිධානයක් තුළ සන්නිවේදනය වැඩි දියුණු කිරීම සඳහා යොදා ගැනෙන, වදන් සැකසුම, විද්‍යුත් තැපැල, හඬ තැපැල, පේජර් වැනි තොරතුරු තාක්ෂණික මෙවලම් භාවිත කෙරෙන තොරතුරු පද්ධතිය වනුයේ,
(1) ගනුදෙනු සැකසුම් පද්ධතියයි. (TPS)
(2) කාර්යාල ස්වයංකරණ පද්ධතියයි. (OAS)
(3) කළමනාකරණ උපකාරක පද්ධතියයි. (MSS)
(4) තීරණ උපකාරක පද්ධතියයි. (DSS)
(5) විධායක උපකාරක පද්ධතියයි. (ESS) (.........)

30. සමස්ත ව්‍යාපාර සැලැස්ම පිළිබඳ පූර්ව අදහසක් ලබා ගැනීම සඳහා කියවිය යුතු වන්නේ ව්‍යාපාර සැලැස්මක,
(1) පටුනයි. (2) විධායක සාරාංශයයි
(3) ව්‍යාපාර විස්තරයයි. (4) අලෙවිකරණ සැලැස්මයි.
(5) මූල්‍ය සැලැස්මයි. (.........)

● අංක **31** සිට **40** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී **සුදුසු වචන** යොදා හිස්තැන් පුරවන්න.

31. ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසරය අධ්‍යයනයෙන් .... හා .... ද, බාහිර පරිසරය අධ්‍යයනයෙන් .... හා .... ද හඳුනාගත හැකි ය.

32. (අ) හොඳ දේ කිරීමත් නරක දේ නොකිරීමත් ....ලෙස සැලකේ.

(ආ) ස්වාභාවික පරිසරයක් හෝ සංස්කෘතියක් කෙළෙසෙන කිසිවක් නොකරන බවට එක්සත් ජාතීන්ගේ සාමාජික රටවල් ඇති කරගෙන තිබෙන සම්මුතිය .... ලෙස හැඳින්වේ.

33. ආදායම් බදු සහ සමාගම් බදු .... බදු ලෙස වර්ග කළ හැකි අතර රේගු බදු හා දේශීය භාණ්ඩ බදු .... බදු ලෙස වර්ග කළ හැකි ය.

34. (අ) කිසියම් ව්‍යාපෘතියක් කරගෙන යාම සඳහා නිශ්චිත කාලයකට ව්‍යාපාර ආයතන දෙකක් හෝ වැඩි ගණනක් එක්ව පිහිටුවා ගන්නා සන්ධානය .... ලෙස හැඳින්වේ.

(ආ) වරලත් හිමියාගේ වෙළඳ ලකුණ යටතේ භාණ්ඩ නිෂ්පාදනය කර බෙදාහැරීමට වරලත් ලාභියාට අයිතිය පැවරෙන වරලත් ව්‍යාපාර හැඳින්වෙනුයේ .... යනුවෙනි.

35. (අ) ව්‍යාපාර ආයතනයක සේවකයින්ගේ නිර්මාණශීලිත්වය තුළින් ඇතිවන ව්‍යවසායකත්වය හඳුන්වනුයේ .... නමිනි.

(ආ) සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට මූල්‍ය පහසුකම් ලබා දීමට රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවත්, කාර්මික සංවර්ධන මණ්ඩලයත් එක්ව ක්‍රියාත්මක කරන ණය යෝජනා ක්‍රමය .... ලෙස හැඳින්වේ.

36. (අ) ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍රයක් (ATM) හරහා ගනුදෙනු කිරීමේ දී අදාළ කාඩ්පත ඇතුළු කිරීමෙන් පසු .... සටහන් කළ යුතු ය.

(ආ) .... හා .... දනට ලොව පුරා භාවිතයේ පවතින ජනප්‍රිය ණයපත් වර්ග දෙකකි.

37. (අ) නිශ්චිත කාලපරිච්ඡේදයක් තුළ රටක අපනයන භාණ්ඩවල වටිනාකම හා ආනයන භාණ්ඩවල වටිනාකම අතර වෙනස .... ලෙස හැඳින්වේ.

(ආ) අන්තර්ජාලය හරහා භාණ්ඩ මිලට ගැනීම, විකිණීම, ඊට පෙර හා පසු සියලු කටයුතු .... ලෙස සැලකේ.

38. (අ) විෂම ගතිලක්ෂණවලින් යුත් සමස්ත වෙළඳපොළ සමජාතීය ගතිලක්ෂණවලින් යුත් කණ්ඩායම්වලට බෙදා වෙන්කිරීම .... ලෙස හැඳින්වේ.

(ආ) පහත වගුවේ හිස්තැන් සම්පූර්ණ කරන්න.

අලෙවිකරණ මිශ්‍රය අලෙවිකරුගේ දෘෂ්ටියෙන්	අලෙවිකරණ මිශ්‍රය ගනුදෙනුකරුගේ දෘෂ්ටියෙන්
1. නිෂ්පාදිතය	1. ....
2. මිල	2. ....
3. ස්ථානය/ බෙදාහැරීම	3. ....
4. ප්‍රවර්ධනය	4. ....

39. (අ) කොළඹ කොටස් වෙළඳපොළ කටයුතු අධීක්ෂණය හා විධිමත් කිරීම පිණිස පිහිටුවා ඇති ආයතනය වනුයේ .... යි.

(ආ) කොළඹ කොටස් වෙළඳපොළෙහි කොටස් ගනුදෙනු නිෂ්කාශණ මධ්‍යස්ථානය වශයෙන් කටයුතු කරන ආයතනය වනුයේ .... යි.

40. (අ) අන්තර්ජාල වෙබ් අඩවිවල ඇතුළත් ගොනු (file) පිටපත් කර ගැනීමට හා හුවමාරු කිරීමට යොදා ගැනෙන ක්‍රමය .... ලෙස හැඳින්වේ.

(ආ) පුද්ගලයකු හෝ ආයතනයක් අන්තර්ජාල පහසුකම් ලබාගත යුතු වන්නේ .... මාර්ගයෙනි.

- අංක **41** සිට **50** තෙක් ප්‍රශ්නවලට නිශ්චිත පිළිතුරු සපයන්න.

41. නිෂ්පාදනයක් ස්වභාවය (මට්ටම්) අනුව කොටස් තුනකටත්, අංශ අනුව කොටස් තුනකටත් බෙදා දැක්විය හැකි ය. මෙම කොටස් වෙන් වෙන් වශයෙන් දක්වන්න.

ස්වභාවය අනුව	අංශ අනුව
1.	1. ....
2.	2. ....
3.	3. ....

42. (අ) අසාධාරණ වෙළඳ පිළිවෙත්වලට එරෙහිව ශ්‍රී ලංකාවේ පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම සඳහා ස්ථාපිත රාජ්‍ය ආයතනය කුමක් ද?

....

(ආ) ඔබ සඳහන් කළ ආයතනය කවර අමාත්‍යාංශයක් යටතේ පාලනය වන්නේ ද?

....

43. ජාත්‍යන්තරව පිළිගත් සමුපකාර ප්‍රතිපත්ති **හතරක්** සඳහන් කරන්න.

1. ....
2. ....
3. ....
4. ....

44. (අ) "ස්වාධීනව අයිති හා ස්වාධීනව ක්‍රියාත්මක වන එසේම ක්ෂේත්‍රය තුළ බලයක් හිමි නොවූ ව්‍යාපාර කුඩා ව්‍යාපාර වේ." මෙම නිර්වචනය ඉදිරිපත් කර ඇත්තේ කවර ආයතනයක් විසින් ද?

....

(ආ) ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට කුඩා ව්‍යාපාරවලින් ලැබිය හැකි ප්‍රධාන දායකත්ව **හතරක්** නම් කරන්න.

1. ....
2. ....
3. ....
4. ....

The National e-Learning Portal for The General Education

45. (අ) EU, WTO, ASEAN සහ SAARC යන සංවිධාන අතුරෙන් වෙළඳ කලාපයක් **නො වන්නේ** කුමක් ද?

....

(ආ) ආනයනය කරන ලද භාණ්ඩ වරායෙන් පිටතට ගෙනවුත් නැවත සකස් කර හෝ නොකර හෝ අපනයනය කිරීම හඳුන්වනුයේ කවර නමකින් ද?

....

46. (අ) සංවිධානයක් පවතින්නේ කුමක් සඳහා ද එහි දර්ශනය කුමක් ද මූලික අරමුණු කවරේ ද යන්න විස්තර කෙරෙන ප්‍රකාශය කුමක් ද?

....

(ආ) තීරණ ගැනීමට මුළුමනින් ම සේවකයන්ට අවකාශ ලබා දෙන නායකයා හඳුන්වනු ලබන්නේ කවර නමකින් ද?

....

47. (අ) එකම වර්ගයේ භාණ්ඩයක් අඛණ්ඩව, රේඛීයව ගලා යන ආකාරයට විශාල ඒකක ප්‍රමාණයකින් නිෂ්පාදනය කිරීම හැඳින්වෙන නිෂ්පාදන ක්‍රමය කුමක් ද?

....

(ආ) යෙදවුම් සහ නිමැවුම් අතර පවතින අනුපාතික සම්බන්ධතාව හැඳින්වෙන්නේ කවර නමකින් ද?

....

48. (අ) රැකියාවට ඉතා ම යෝග්‍ය පුද්ගලයාට තිබිය යුතු අධ්‍යාපනය, පළපුරුද්ද සහ කුසලතා පිළිබඳ ව විස්තර කෙරෙන ලේඛනය හැඳින්වෙන්නේ කවර නමකින් ද?

....

(ආ) ආයතනයක ප්‍රධාන තනතුරුවල ඇතිවිය හැකි පුරප්පාඩු පිරවීම සඳහා සුදුසු සේවකයන් හඳුනාගැනීමට සකස් කෙරෙන වැඩපිළිවෙළ හැඳින්වෙන්නේ කවර නමකින් ද?

....

49. පහත වගුවේ X තීරුවේ දක්වෙන්නේ පරිගණක ගත තොරතුරු පද්ධතියක උපාංගවලට නිදසුන් ය. ඒ එක් එක් නිදසුනට ගැළපෙන උපාංගය Y තීරුවේ ලියා දක්වන්න.

X	Y
1. වින්ඩෝස් (Windows)	1. ....
2. පරිගණක වැඩසටහන්කරු	2. ....
3. මොනිටරය	3. ....
4. නීතිරීති හා ප්‍රතිපත්ති	4. ....

50. (අ) ව්‍යාපාර සැලැස්මක අන්තර්ගතවන, ඇස්තමේන්තුගත මුදල් ගලා ඒම්, මුදල් ගලා යාම් සහ මුදල් ශේෂය දක්වෙන ලේඛනය හැඳින්වෙන්නේ කවර නමකින් ද?

....

(ආ) ඇස්තමේන්තුගත යන්ත්‍ර සූත්‍ර පිරිවැය සහ අමුද්‍රව්‍ය අවශ්‍යතා පෙන්නුම් කෙරෙන්නේ ව්‍යාපාර සැලැස්මක කුමන කොටසෙහි ද?

....

* * *

56581

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved] AL/2012/32/S-II

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2012 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2012 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2012

නව නිර්දේශය
புதிய பாடத்திட்டம்
New Syllabus

ව්‍යාපාර අධ්‍යයනය II
வணிகக் கல்வி II
Business Studies II

32 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

උපදෙස්:

* එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න **දෙක** බැගින්වත් තෝරාගෙන ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

I කොටස

1. පහත දක්වෙන නිර්වචනය ඇසුරෙන් (i) (ii) හා (iii) කොටස්වලට පිළිතුරු සපයන්න.
"ලාභ ලැබීමේ අරමුණින් පවත්වාගෙන යන, මිනිස් අවශ්‍යතා හා වුවමනා තෘප්තිමත් කිරීම සඳහා වන භාණ්ඩ හා සේවා නිෂ්පාදනය, බෙදාහැරීම, වෙළඳාම හා අනුබද්ධිත සියලු සේවා, ව්‍යාපාර ලෙස අර්ථ දක්විය හැකි ය."
   (i) අයෝජකයින්ට ලාභ උපයා දීමට අමතර ව ව්‍යාපාරවලින් වෙනත් ඇල්මැති පාර්ශ්වවලට ලැබෙන ප්‍රතිලාභ කවරේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 04)
   (ii) ඉහත නිර්වචනයේ අඩංගු පහත දක්වෙන සංකල්ප පැහැදිලි කරන්න.
      (අ) අවශ්‍යතා හා වුවමනා
      (ආ) භාණ්ඩ හා සේවා (ලකුණු 04)
   (iii) (අ) 'වෙළඳාම' අර්ථ දක්වන්න.
      (ආ) අනුබද්ධිත සේවා නම් කරන්න.
      (ඉ) ප්‍රාථමික නිෂ්පාදනය හා ද්විතියික නිෂ්පාදනය සසඳන්න.
      (ඊ) බෙදාහැරීමේ නියුක්ත අතරමැදියන් **දෙදෙනකු** නම් කරන්න. (ලකුණු 04)
   (iv) (අ) ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසර බලවේග නම් කරන්න.
      (ආ) එම බලවේගවලින් ඕනෑම **දෙකක්** තෝරාගෙන, ඒවා ව්‍යාපාරයේ ක්‍රියාකාරිත්වයට බලපාන ආකාරය වෙන් වෙන් වශයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)
   (v) පහත සඳහන් ව්‍යාපාර ආචාරධර්ම සංකල්ප පැහැදිලි කරන්න.
      (අ) සත්‍ය දෑ සන්නිවේදනය කිරීම
      (ආ) අන් අයට හානි නොකිරීම (ලකුණු 04)
   (මුළු ලකුණු 20)

2. (i) (අ) රජයක ආර්ථික අරමුණු **හතරක්** නම් කරන්න.
      (ආ) එම අරමුණු ඉටු කර ගැනීමට ව්‍යාපාරවලට දායක විය හැකි ආකාර **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04)
   (ii) (අ) රජයට ආදායම් ලැබෙන ප්‍රධාන මාර්ග ලෙස සෘජු හා වක්‍ර බදු දැක්විය හැකි ය. සෘජු බදු හා වක්‍ර බදු නිදසුන් සහිත ව වෙන වෙන ම පැහැදිලි කරන්න.
      (ආ) 'GMP සහතිකකරණය' හඳුන්වන්න.
      (ඉ) දේශීය වශයෙන් නිපදවනු ලබන යම් යම් ආහාර නිෂ්පාදන වෙළඳපොළට ඉදිරිපත් කිරීම සඳහා SLS ප්‍රමිතිය අනිවාර්ය වේ. එවැනි ආහාර නිෂ්පාදිත **දෙකක්** නම් කරන්න. (ලකුණු 04)
   (iii) අමල්, බිමල් හා වමල් හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යති. පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් ඔවුන් අතර මතභේදයක් පැන නැගී ඇත.
      1. ලාභ බෙදාගැනීමේ අනුපාතය
      2. යෙදූ ප්‍රාග්ධනයට පොලී ලබා ගැනීම
      3. සක්‍රිය හවුල්කරුවන් වන බිමල්ට හා වමල්ට වැටුප් ලබා ගැනීම
      4. අමල් සපයා ඇති ණය මුදලට පොලී ලබා ගැනීමට ඉල්ලුම් කිරීම

   හවුල්කරුවන් අතර පවතින ගිවිසුමේ මේ කරුණු සම්බන්ධයෙන් කිසිවක් සඳහන් නො වේ. 1890 හවුල් ව්‍යාපාර ආඥා පනත අනුව මෙම අවස්ථාවේ හවුල්කරුවන් කටයුතු කළ යුතු ආකාරය වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්න. (ලකුණු 04)
   (iv) 2007 අංක 07 දරන සමාගම් පනත අනුව සීමාසහිත පෞද්ගලික සමාගමක් ලියාපදිංචි කිරීම සඳහා අයදුම්පත්‍රය සමඟ සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ලියවිලි නම් කර පැහැදිලි කරන්න. (ලකුණු 04)
   (v) (අ) වරලත් ව්‍යාපාරයක් යනු කුමක්දැයි පැහැදිලි කරන්න.
      (ආ) වරලත් ව්‍යාපාර සංවිධාන ක්‍රමය මගින් වරලත් හිමියාට සහ වරලත් ලාභියාට ලැබෙන ප්‍රතිලාභ **තුන** බැගින් වෙන වෙන ම සඳහන් කරන්න. (ලකුණු 04)
   (මුළු ලකුණු 20)

[දෙවෙනි පිටුව බලන්න.

3. (i) (අ) ව්‍යවසායකයා, ව්‍යවසායකත්වය හා ව්‍යාපාර අතර පවත්නා සම්බන්ධතාව කුමක්දැයි පැහැදිලි කරන්න.
(ආ) ව්‍යවසායකයින් බිහි වීමට පසුබිම් වන සාධක **හතරක්** පැහැදිලි කරන්න (ලකුණු 04)

(ii) කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සංවර්ධනය සඳහා 2012 රාජ්‍ය අයවැය ලේඛනය මගින් යෝජිත ක්‍රියාමාර්ග පිළිබඳ විමසීමක් කරන්න. (ලකුණු 04)

(iii) (අ) පොදු පිළිගැනීම හොඳ මුදලක ගුණාංගයකි. ගනුදෙනුවේ දී පොදු පිළිගැනීමක් ඇති වීමට නම් මුදල් තවත් ගුණාංග කිහිපයකින් යුක්ත විය යුතු ය. එවැනි ගුණාංග **හතරක්** සඳහන් කරන්න.
(ආ) පහත දක්වෙන මුදල් වර්ග පැහැදිලි කරන්න.
1. ණය මුදල්
2. ව්‍යවහාර මුදල් (නියෝග මුදල්) (ලකුණු 04)

(iv) ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතියේ නියමුවා වන ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුණු නම් කර එම අරමුණු සාක්ෂාත් කර ගන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 04)

(v) වර්තමානයේ බොහොමයක් බැංකු සේවා විද්‍යුත් ආකාරයෙන් සිදු වේ. විද්‍යුත් බැංකුකරණය යටතේ සිදුවන සේවාවන් **හතරක්** පැහැදිලි කරන්න. (ලකුණු 04)

(මුළු ලකුණු 20)

4. (i) (අ) රක්ෂණයෙන්
1. පුද්ගලයාට හා පවුලටත්
2. ව්‍යාපාරවලටත්
ලැබෙන ප්‍රතිලාභ වෙන් වෙන් වශයෙන් පැහැදිලි කරන්න.
(ආ) රක්ෂණය හා සම්බන්ධ පහත සඳහන් පද පැහැදිලි කරන්න.
1. අවදානම හා උපද්‍රවය (Risk and Cause)
2. අලාභ හා හානි (Loss and Damage) (ලකුණු 04)

(ii) මෑත කාලයේ ශ්‍රී ලංකාවේ මහා මාර්ග ප්‍රවාහන පද්ධතියේ කැපී පෙනෙන සංවර්ධනයක් ලෙස දක්ෂිණ අධිවේගී මාර්ගය සඳහන් කළ හැකි ය. මෙවැනි අධිවේගී මාර්ග ප්‍රවාහනයේ කාර්යක්ෂමතාව වැඩි වීමට බලපාන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 04)

(iii) සන්නිවේදන ක්‍රියාවලියේ අන්තර්ගත ප්‍රතිචාරය සහ ප්‍රතිපෝෂණය වෙන් වෙන් ව හඳුන්වන්න. (ලකුණු 04)

(iv) සිල්ලර වෙළඳාමේ නව ප්‍රවණතාවකි 'සුපිරි වෙළඳසැල්'. මෙම සුපිරි වෙළඳසැල් පාරිභෝගිකයින් අතර ජනප්‍රිය වීමට බලපා ඇති හේතු සාකච්ඡා කරන්න. (ලකුණු 04)

(v) (අ) තොග වෙළඳාම අර්ථ දක්වන්න.
(ආ) තොග වෙළෙඳුන් වර්ග **දෙකක්** නම් කරන්න.
(ඉ) තොග වෙළෙන්දාගෙන් ඉටු වන කාර්ය **හතරක්** නම් කරන්න. (ලකුණු 04)

(මුළු ලකුණු 20)

II කොටස

5. (i) සංවිධානයක අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීම පිණිස කළමනාකරණ ක්‍රියාවලිය උපකාර වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) (අ) මෙහෙයවීම යනුවෙන් අදහස් කෙරෙන්නේ කුමක් ද?
(ආ) හොඳ නායකයකු තුළ තිබිය යුතු ගුණාංග **හතරක්** සඳහන් කරන්න.
(ඉ) ප්‍රජාතන්ත්‍රවාදී නායකත්ව ශෛලිය හඳුන්වන්න. (ලකුණු 04)

(iii) (අ) බලතල පැවරීමෙන් ලබා ගත හැකි ප්‍රතිලාභ කවරේ ද?
(ආ) සමහර විට සැලසුම් අසාර්ථක වේ. එසේ සැලසුම් අසාර්ථක වීමට බලපාන හේතු **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04)

(iv) (අ) මෙහෙයුම් කළමනාකරණයට අදාළ පරිවර්තන ක්‍රියාවලියේ ස්වභාවය පෙන්නුම් කරන්න.
(ආ) තොග පාලනය කිරීමේ ක්‍රමයක් ලෙස JIT ක්‍රමය වැදගත්වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 04)

(v) කොන්ත්‍රාත්කරුවකුට ක්‍රීඩා සංකීර්ණයක් ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්තුවක් ලැබී ඇත. මෙම ඉදිකිරීම සඳහා වඩාත් ම යෝග්‍ය පිරියත සැලැස්ම නම් කරන්න. ඔබ නම් කළ පිරියත සැලැස්මේ ස්වභාවය ද පැහැදිලි කරන්න. (ලකුණු 04)

(මුළු ලකුණු 20)

[තුන්වෙනි පිටුව බලන්න.

6. (i) (අ) නිෂ්පාදිතයක ගුණත්වය යනුවෙන් අදහස් කෙරෙන්නේ කුමක්ද'යි පැහැදිලි කරන්න.
(ආ) පහත සඳහන් සංකල්ප පැහැදිලි කරන්න.
1. සමස්ත ගුණත්ව කළමනාකරණය (TQM)
2. ආර්ථික ඇණවුම් ප්‍රමාණය (EOQ) (ලකුණු 04)

(ii) පහත දක්වෙන අලෙවිකරණ හර සංකල්ප පැහැදිලි කරන්න.
1. වටිනාකම හා තෘප්තිය
2. හුවමාරුව හා ගනුදෙනු (ලකුණු 04)

(iii) වර්තමානයේ අලෙවිකරුවෝ ගනුදෙනුකරුවන්ට වැඩි වටිනාකමක් ලබාදීම සඳහා සිය නිෂ්පාදිත විවිධ මට්ටම් යටතේ වෙළඳපොළට ඉදිරිපත් කරති. නිෂ්පාදිතයක් ඉදිරිපත් කෙරෙන විවිධ මට්ටම් අනුපිළිවෙළින් නම් කර, ඒවා වෙන් වෙන් වශයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(iv) කෘෂිකර්ම ක්ෂේත්‍රය පිළිබඳ දැනුමක් හා පළපුරුද්දක් ඇති මහීපාල මහතා ගොයම් මැඩීම සඳහා නව යන්ත්‍රයක් නිර්මාණය කර ඇත. මෙම යන්ත්‍රයේ කාර්යක්ෂමතාව පිළිබඳ ව අදාළ කෘෂිකර්ම පර්යේෂණ ආයතනවල සහතිකකරණය ද ලැබී තිබේ. මෙම යන්ත්‍රය නිපදවා වෙළඳපොළට ඉදිරිපත් කිරීමට ඔහු සූදානමින් සිටී. මෙම යන්ත්‍රය වෙළඳපොළට හඳුන්වාදීමට සුදුසු ප්‍රවර්ධන උපකරණයක් ගැන ඔහු සලකා බලමින් සිටී.
ව්‍යාපාර අධ්‍යයනය හැදෑරූ ශිෂ්‍යයකු හැටියට මහීපාල මහතාගේ ගොයම් මැඩීමේ යන්ත්‍රය වෙළඳපොළට හඳුන්වාදීමට වඩාත් යෝග්‍ය ප්‍රවර්ධන උපකරණය නිර්දේශ කරන්න. ඔබ එම ප්‍රවර්ධන උපකරණය නිර්දේශ කිරීමට හේතු පැහැදිලි කරන්න. (ලකුණු 04)

(v) (අ) ව්‍යාපාරයක කාරක ප්‍රාග්ධනය යනු කුමක් ද?
(ආ) ප්‍රමාණවත් කාරක ප්‍රාග්ධනයක් නොමැති වීමෙන් ඇති විය හැකි අහිතකර ප්‍රතිඵල කවරේ ද?
(ඉ) ප්‍රමාණවත් කාරක ප්‍රාග්ධනයක් නොමැති අවස්ථාවක එය වැඩි කර ගැනීම සඳහා ගත හැකි කෙටිකාලීන පියවර කවරේ ද? (ලකුණු 04)
(මුළු ලකුණු 20)

7. (i) සීමාසහිත දර්ශන සමාගමේ ශේෂ පත්‍රයෙන් උපුටාගත් තොරතුරු කිහිපයක් පහත දැක්වේ.
❄ සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය රුපියල් මිලියන 10
❄ 10% වරණීය කොටස් ප්‍රාග්ධනය රුපියල් මිලියන 8
❄ 12% ණයකර රුපියල් මිලියන 7
වසර කිහිපයක සිට මෙම සමාගමේ ලාභදායකත්වය ද පහළ මට්ටමක පවතී.
දර්ශන සමාගමට රුපියල් මිලියන 2 ක අතිරේක අරමුදලක් ලබා ගැනීමට අවශ්‍ය වී ඇත.
මෙම අතිරේක අරමුදල් ලබා ගැනීමට වඩා යෝග්‍ය මූල්‍ය මාර්ගය සාමාන්‍ය කොටස් ද? වරණීය කොටස් ද? ණයකර ද? ඔබගේ පිළිතුරට හේතු පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) (අ) සීමාසහිත පොදු සමාගමකට කොළඹ කොටස් වෙළඳපොළ තුළ ලැයිස්තුගත විය හැකි ක්‍රම දෙකක් පහත දැක්වේ.
1. මූලික නිකුතුව තුළින් (Offer for subscription)
2. විකුණුම් අර්පණයක් මගින් (Offer for sale)
මෙම ක්‍රම **දෙක** වෙන වෙන ම පැහැදිලි කරන්න.
(ආ) කොටස් වෙළඳපොළේ හුවමාරු වන සාමාන්‍ය කොටස්වල ආයෝජනය තුළින් ආයෝජකයකුට අත්වන ප්‍රතිලාභ **හතරක්** නම් කරන්න. (ලකුණු 04)

(iii) පහත දක්වෙන්නේ පාසල් විවාද කණ්ඩායමට ලැබුණු මාතෘකාවකි.
"සංවිධානයකට වඩා වැදගත් වන්නේ මානව සම්පත ද? නොඑසේ නම් සෙසු සම්පත් ද?"
ඔබ නියෝජනය කරන්නේ **මානව සම්පත වඩා වැදගත් ය** යන පාර්ශ්වය නම් එම අදහස සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන කරුණු පැහැදිලි කරන්න. (ලකුණු 04)

(iv) (අ) රැකියා විස්තරයකින් ප්‍රකාශ කෙරෙන්නේ කුමක් ද?
(ආ) රැකියා පිරිවිතරයකින් ප්‍රකාශ කෙරෙන්නේ කුමක් ද?
(ඉ) අනුස්ථාපනයෙන් කුමන ප්‍රතිලාභ අපේක්ෂා කෙරේ ද?
(ඊ) වැඩ වර්ජනවලට පිවිසෙන්නේ නැතිව සේවකයින්ට ගත හැකි වෙනත් වෘත්තීය ක්‍රියාමාර්ග **දෙකක්** නම් කරන්න. (ලකුණු 04)

(v) (අ) කාර්යඵල ඇගයීම යනු කුමක්ද'යි හඳුන්වා, එමගින් ආයතනයක් අපේක්ෂා කරන අරමුණු කවරේද'යි පැහැදිලි කරන්න.
(ආ) පහත සඳහන් දෑ කෙටියෙන් පැහැදිලි කරන්න.
1. සාමූහික කේවල් කිරීම
2. පසුබිම පරීක්ෂණ (ලකුණු 04)
(මුළු ලකුණු 20)

[හතරවෙනි පිටුව බලන්න.

8. (i) පහත දක්වෙන තොරතුරු පද්ධති හඳුන්වා ව්‍යාපාර ආයතනයක් තුළ ඒවා පරිශීලනය කරන පුද්ගලයන් නම් කරන්න.
   1. ගනුදෙනු සැකසුම් පද්ධති (TPS)
   2. විධායක උපකාරක පද්ධති (ESS)

(ලකුණු 04)

(ii) නූතන තොරතුරු තාක්ෂණය භාවිතයෙන් ව්‍යාපාර ආයතනයකට ලැබිය හැකි ප්‍රතිලාභ පැහැදිලි කරන්න.

(ලකුණු 04)

(iii) පහත සඳහන් දෑ පිළිබඳ කෙටි සටහන් ලියන්න.
   1. ලෝක ව්‍යාප්ත වෙබ් (www)
   2. බාහිර ජාලය (Extranet)

(ලකුණු 04)

(iv) දැරීමට සිදුවන පිරිවැය හා කාලය ගැන සලකා සමහර ව්‍යාපාරිකයෝ ව්‍යාපාර සැලසුම් සකස් කිරීමට මැළිකමක් දක්වති. ව්‍යාපාර සැලසුම් ගැන අධ්‍යයනය කර ඇති ඔබ මෙවැනි ව්‍යාපාරිකයන්ට ව්‍යාපාර සැලැස්මක ඇති වැදගත්කම අවබෝධ කර දෙන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 04)

(v) (අ) සාමාන්‍යයෙන් ව්‍යාපාරයක වර්ෂයක් අවසානයේ සකස් කෙරෙන මූල්‍ය ප්‍රකාශ සහ ව්‍යාපාර සැලැස්මක ඇතුළත් කෙරෙන මූල්‍ය ප්‍රකාශ අතර කවර වෙනසක් ඔබ දකින්නේ ද?

(ආ) ව්‍යාපාරිකයකුට ලිඛිත ව්‍යාපාර සැලැස්මකින් ලැබිය හැකි ප්‍රයෝජන බොහෝ ය. එවැනි ප්‍රයෝජන **හතරක්** සඳහන් කරන්න.

(ලකුණු 04)

(මුළු ලකුණු 20)

* * *

ඉ-තක්සලාව
The National e-learning Portal for The General Education